157096



සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.20 / 0830 - 1030

සාමාන්‍ය පොදු පරීක්ෂණය
பொதுச் சாதாரணப் பரீட்சை
Common General Test

12 S

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:** ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
※ **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**
※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
※ උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිලිමත් ව කියවන්න.
※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන** පිළිතුර තෝරා ගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය පැණි බීම කර්මාන්තය සඳහා අන්තර්ගත සීනි මට්ටම පදනම් කොටගත් වර්ණ කේත පද්ධතියක් හඳුන්වා දී ඇත. මේ සඳහා භාවිත කෙරෙන වර්ණ තුන මොනවා ද?
(1) රතු, තැඹිලි, නිල් (2) රතු, නිල්, කොළ (3) රතු, ඇම්බර්(කහ පැහැය), නිල්
(4) රතු, තැඹිලි, කොළ (5) රතු, ඇම්බර් (කහ පැහැය), කොළ

**2.** "බක් මහ දිවුරුම" නමැති ජාතික ප්‍රතිඥාවක් ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා විසින් 2019 අප්‍රේල් 3 වන දින උත්සවාකාරයෙන් ආරම්භ කරන ලදී. මෙම ප්‍රතිඥාවෙහි අරමුණ කුමක් ද?
(1) වන ජීවීන් සුරැකුම (2) පරිසරය ආරක්ෂා කිරීම (3) ජාතික උරුමය සංරක්ෂණය
(4) මත්ද්‍රව්‍ය උවදුර මුලිනුපුටා දැමීම (5) මිනිස් අයිතිවාසිකම් තහවුරු කිරීම

**3.** එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන විසඳුම් ජාලය විසින්, රටවල් 156ක රටවැසියන් ඔවුනටම දැනෙන පරිදි කෙතරම් සතුටින් සිටින්නේද යන්න පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීමෙන් අනතුරුව ලෝක ප්‍රීතිමත් බව පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරන ලදී. ලෝකයේ ප්‍රීතිමත්ම රටවල් පිළිබඳව එක්සත් ජාතීන්ගේ 2019 වර්ෂයේ ලැයිස්තුවෙහි ඉහළින්ම ඇති රට කුමක් ද?
(1) නෝර්වේ (2) ඩෙන්මාර්කය (3) ෆින්ලන්තය (4) අයිස්ලන්තය (5) නෙදර්ලන්තය

**4.** 1787 වර්ෂයේදී එංගලන්තයේ ලන්ඩන්හි පිහිටුවන ලද, ක්‍රිකට් පිළිබඳ පාලක සභාව ලෙස පෙර ක්‍රියාත්මක වූ මාලිබෝන් ක්‍රිකට් සංගමය (MCC) විසින් එහි ප්‍රථම බ්‍රිතාන්‍ය නොවන සභාපතිවරයා, 2019 ඔක්තෝබර් 01 දින සිට වර්ෂයක කාලයක් සඳහා පත් කරනු ලැබ තිබේ. මෙම පුද්ගලයා කවුරුන් ද?
(1) බ්‍රයන් ලාරා (2) කුමාර් සංගක්කාර (3) මහේල ජයවර්ධන
(4) සුනිල් ගවස්කාර් (5) වසීම් අක්‍රම්

**5.** මාස පහකටත් අඩු කාලයක් තුළ සිදුවූ මාරක ගුවන් අනතුරු දෙකක සමානකම් ප්‍රකට කළ සාක්ෂි හේතු වශයෙන් දක්වා, 2019 මාර්තු මස වන විට රටවල් 50කට වැඩි සංඛ්‍යාවක් එක්තරා මාදිලියක බෝයිං (Boeing) ගුවන් යානා, භාවිතයෙන් ඉවත් කළ හ. මෙම ගුවන්යානා මාදිලිය කුමක් ද?
(1) 737 Classic (2) 737 MAX (3) 747 (4) 767-400 ER (5) 777-200 ER

**6.** 2018 වර්ෂයේදී ශ්‍රී ලංකා තේ සඳහා ප්‍රමුඛතම ගැනුම්කරුවා වූ රට කුමක් ද?
(1) රුසියාව (2) තුර්කිය (3) ඉරාකය (4) ඉරානය (5) ලිබියාව

**7.** පොදු මහජනතාවට තොරතුරු ලබාදීමත් රාජ්‍ය ආයතනවලින් සේවා ලබා ගන්නේ කෙසේදැයි මඟ පෙන්වීමත් සඳහා රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයෙහි ත්‍රෛභාෂා ඇමතුම් මධ්‍යස්ථාන පහසුකම් ඇත. මෙම සේවාව ඇමතීම සඳහා වන ගාස්තු රහිත දුරකථන අංකය කුමක් ද?
(1) 1900 (2) 1919 (3) 1960 (4) 1980 (5) 1991

**8.** වෙළෙඳපොළෙහි ඇති සමහර ආනයනික කිරිපිටි වර්ගවල සුවිශේෂ රසායනික සංයෝගයක් අඩංගු බවට මෑතකාලයේදී මතභේදයක් පැවතිණි. මෙම රසායනික සංයෝගය වන්නේ,
(1) මෙලමයින් ය. (2) මැලතියොන් ය. (3) මෙතනෝල් ය.
(4) මෝර්ෆීන් ය. (5) නිකොටීන් ය.

[දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

**9.** 2022 දී චීනයේ හැන්ෂොන්හි පැවැත්වෙන ආසියානු ක්‍රීඩා උළෙලෙහි තරග වැඩසටහනට නැවත හඳුන්වාදීමට ආසියානු ඔලිම්පික් සභාව තීරණය කර ඇත්තේ පහත කුමන ක්‍රීඩාව ද?
(1) ටෙනිස් (2) බැඩ්මින්ටන් (3) පාපන්දු (4) ක්‍රිකට් (5) බේස්බෝල්

**10.** මෙම ලාංඡනය නියෝජනය කරන්නේ කවර සංවිධානය ද?
(1) ලෝක බැංකුව
(2) ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO)
(3) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF)
(4) ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO)
(5) එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සාංස්කෘතික සංවිධානය (UNESCO)

**11.** රාජා 4.5% වාර්ෂික සුළු පොළී අනුපාතිකය යටතේ රු. 3240ක් ආයෝජනය කළේ ය. පොළිය ලෙස රු. 729ක් රාජාට ලැබීමට කොපමණ කාලයක් ගත වේ ද?
(1) අවුරුදු 3.5 (2) අවුරුදු 4 (3) අවුරුදු 4.5
(4) අවුරුදු 5 (5) අවුරුදු 5.5

**12.** $\oplus$ යන ගණිත කර්මය, ඕනෑම $x$ සහ $y$ නම් සංඛ්‍යා දෙකක් මත අර්ථ දක්වනු ලබන්නේ, $x \oplus y = x(x+y) - y$ ලෙසිනි. $(1 \oplus 2) - (2 \oplus 1)$ හි අගය කීය ද?
(1) $-4$ (2) $-3$ (3) 2 (4) 3 (5) 4

**13.** පාවිච්චි කරන ලද මෝටර් රථයක් රු. මිලියන 3.2කට මිලට ගත් මෝටර් රථ ගරාජ් හිමියෙක්, එය අලුත්වැඩියා කිරීමට රු. 800 000ක් වැය කර රුපියල් මිලියන 4.8කට විකුණයි. ඔහුගේ ලාභ ප්‍රතිශතය කොපමණ ද?
(1) 15.5% (2) 16% (3) 18% (4) 20% (5) 22%

**14.** එක් ශිෂ්‍යයෙක් ගණිත පරීක්ෂණයක් සඳහා ලකුණු 45ක් ලබා ගත්තේය. නමුත් එය ලකුණු ලැයිස්තුවෙහි 75 යනුවෙන් වැරදි ලෙස සටහන් විය. එම වරද නිවැරදි කිරීමෙන් පසු එම පරීක්ෂණය සඳහා පන්තියෙහි සාමාන්‍යය (මධ්‍යන්‍යය) ලකුණු 1.5 කින් පහළ ගියේය. ගණිත පරීක්ෂණයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව කීය ද?
(1) 15 (2) 20 (3) 25 (4) 35 (5) 40

**15.** අමල් 15 km ධාවන තරගයක් නිම කිරීම සඳහා සාමාන්‍යයෙන් හානුට වඩා පැය ½ ක් වැඩියෙන් ගනියි. අමල් ඔහුගේ වේගය දෙගුණ කළහොත්, තරගය නිම කිරීමට හානුට වඩා පැය ½ ක් අඩුවෙන් ගනියි. අමල්ගේ සාමාන්‍ය වේගය කොපමණ ද?
(1) $8.0\ \text{km h}^{-1}$ (2) $7.5\ \text{km h}^{-1}$ (3) $6.5\ \text{km h}^{-1}$ (4) $6.0\ \text{km h}^{-1}$ (5) $5.0\ \text{km h}^{-1}$


**16.** 1958 දී උපත ලැබූ මෙන්ඩිස් මහතා, 2022 දී, ඔහුගේ පුතා වන ලහිරු මෙන් දෙගුණයක් වයස්ගත වෙයි. ලහිරුගේ දැන් වයස කීය ද?
(1) අවුරුදු 28 යි. (2) අවුරුදු 29 යි. (3) අවුරුදු 30 යි. (4) අවුරුදු 31 යි. (5) අවුරුදු 32 යි.


**17.** ඍජුකෝණාස්‍රයක එක් එක් පැත්තෙහි දිග 40%කින් වැඩි කළහොත්, ඍජුකෝණාස්‍රයෙහි වර්ගඵලයෙහි වැඩිවීමේ ප්‍රතිශතය කොපමණ ද?
(1) 48% (2) 49% (3) 64% (4) 96% (5) 98%

**18.** $A, B, C$ යනු එකම සමාගමක $2:3:4$ අනුපාතයට වැටුප් ලබා ගන්නා සේවකයින් තිදෙනෙකි. ඔවුන්ට පිළිවෙළින් 20%, 20% සහ 30% බැගින් වැටුප් වර්ධක ලැබුණි නම්, එවිට ඔවුන්ගේ වැටුප්වල නව අනුපාතය කුමක් වනු ඇත් ද?
(1) $5:9:13$ (2) $6:6:13$ (3) $6:9:13$ (4) $6:9:14$ (5) $7:9:13$

**19.** එකම නියත ශීඝ්‍රතාවෙන් ක්‍රියාත්මක වන සර්වසම යන්ත්‍ර අටකට මිනිත්තුවකදී භාණ්ඩ 280ක් නිපදවිය හැකිය. එම ශීඝ්‍රතාවෙන්ම ක්‍රියාත්මක වන එම වර්ගයේම යන්ත්‍ර 15කට මිනිත්තු 6 කදී එවැනි භාණ්ඩ කීයක් නිපදවිය හැකි ද?
(1) 2750 (2) 3000 (3) 3150 (4) 3250 (5) 3300

**20.** එකම රටාව අනුගමනය කරනු ලබන්නේ නම්, ඊළඟ රූපය කුමක් විය හැකි ද?








(1) (2) (3) (4) (5)

[තුන්වැනි පිටුව බලන්න.

● අංක **21** සහ **22** ප්‍රශ්න සඳහා, තෝරාගත් ප්‍රදේශයක අනුයාත දින හයක කාලය තුළ එක් එක් දිනයේදී කිසියම් මාරාන්තික නොවන වෛරස් උණක් ආසාදිතව සිටින සහ ඉන් සුවය ලැබූ පුද්ගලයන් සංඛ්‍යා දැක්වෙන පහත ප්‍රස්තාරවලට යොමුවන්න.




**21.** වැඩිම පුද්ගලයන් සංඛ්‍යාවකට වෛරස් උණ රෝගය වැළඳී ඇත්තේ කවදා ද?
(1) සඳුදා (2) අඟහරුවාදා (3) බදාදා (4) බ්‍රහස්පතින්දා (5) සිකුරාදා

**22.** සඳුදා සිට සිකුරාදා තෙක් දින 5ක කාලය තුළදී රෝගයට ගොදුරු වූ පුද්ගලයන් සංඛ්‍යාව කීය ද?
(1) 100 (2) 110 (3) 120 (4) 130 (5) 140

● අංක **23** සහ **24** ප්‍රශ්න සඳහා, ඉහළ යෑමට සැරසෙන සෝපානයක (lift) දොරකඩ සිදු වූ පහත සංවාදය සලකන්න.

පළමුවන පුද්ගලයා : මේ සෝපානයේ අඩු තරමින් තව දෙන්නෙකුටවත් යන්න පුළුවන්.

දෙවන පුද්ගලයා : ඇත්තටම මේකෙ පස්දෙනකුට වඩා යන්න පුළුවන්.

තෙවන පුද්ගලයා : මොන පිස්සු ද? මේකෙ දැනටමත් සෙනඟ වැඩියි. මේක ඉහළ යන්න නම් මට මේකෙන් බහින්නයි වෙන්නෙ.

සිවුවැනි පුද්ගලයා : හරි, හරි, සෝපානය ඇතුළෙ ඉන්නෙ අපි හතරදෙනා විතරයිනෙ.

**23.** ඉහත සංවාදයෙහි පුද්ගලයන් තිදෙනකු පමණක් සත්‍ය කථා කළේ නම්, සෝපානයෙහි ධාරිතාව විය හැක්කේ පුද්ගලයන් කීදෙනකු ද?
(1) දෙදෙනකු (2) තිදෙනකු (3) සිවුදෙනකු
(4) පස්දෙනකු (5) හයදෙනකු

**24.** සෝපානය තුළ සිටින්නේ පුද්ගලයන් දෙදෙනකු පමණක් සහ පුද්ගලයන් හතරදෙනාගෙන් එක් අයකුට වඩා සත්‍ය කථා කළේ නම්, සෝපානයෙහි ධාරිතාව විය හැක්කේ පුද්ගලයන් කී දෙනකු ද?
(1) දෙදෙනකු (2) තිදෙනකු (3) සිවුදෙනකු
(4) පස්දෙනකු (5) හයදෙනකු

● අංක **25** සහ **26** ප්‍රශ්න, පහත දී ඇති විස්තරය මත පදනම් වේ.

අඹගමුව සහ දඹගමුව යනු ගඟකින් වෙන් වූ උපනගර දෙකකි. මෙම උපනගර දෙක යා කෙරෙන මාර්ගය 4 km දිග වන අතර, එහි මැද පාලමක් පිහිටයි. මෙම මාර්ගයෙහි වේග සීමා නියම කර ඇත්තේ පාලම මතදී $20 \text{ km h}^{-1}$ සහ පාලම හැර අනෙක් ස්ථානවලදී $60 \text{ km h}^{-1}$ ලෙස ය.

**25.** යම් වාහනයකට මුළු ගමන ම ඒකාකාර වේගයෙන් යෑමට අවශ්‍ය වේ නම්, එයට අඹගමුව සිට දඹගමුවට යෑමට ගතවන අවම කාලය කොපමණ ද?
(1) මිනිත්තු 7 (2) මිනිත්තු 10 (3) මිනිත්තු 12 (4) මිනිත්තු 15 (5) මිනිත්තු 17

**26.** පෙ.ව. 9.00ට අඹගමුව පසු කර ගිය වාහන දෙකක් පසුව දඹගමුවට සේන්දු විය. පෙ.ව. 9.05 ට දඹගමුවට පැමිණි වාහනය, වේග සීමාව උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් පොලීසිය විසින් නවත්වා ගන්නා ලද අතර, පෙ.ව. 9.06 ට දඹගමුවට පැමිණි අනෙක් වාහනයට එසේ නොවිණි. පාලමෙහි දිග විය හැක්කේ පහත සඳහන් කවරක් ද?
(1) 0.25 km (2) 0.5 km (3) 0.75 km (4) 1.0 km (5) 1.25 km

**27.**

| | |
|---|---|
| නිරීක්ෂණය | X > 1 |
| නිගමනය | Y = 2 |

ඉහත නිරීක්ෂණ-නිගමන යුගලය සත්‍ය බව දී ඇත්නම්, එවිට අවශ්‍යයෙන්ම සත්‍ය වන්නේ පහත සඳහන් කවර නිරීක්ෂණ-නිගමන යුගලය ද?

| | (1) | (2) | (3) | (4) | (5) |
|---|---|---|---|---|---|
| නිරීක්ෂණය | X > 2 | X = 1 | X ≤ 2 | Y = 2 | Y > 2 |
| නිගමනය | Y > 2 | Y = 2 | Y ≤ 2 | X = 2 | X ≤ 1 |

- අංක **28, 29** සහ **30** ප්‍රශ්න, පහත දී ඇති තොරතුරු මත පදනම් වේ.

ඇනවුම් මත පොහොර නිපදවනු ලබන කර්මාන්ත ශාලාවක යන්ත්‍ර තුනක් ඇත. සෑම යන්ත්‍රයකටම ඕනෑම වර්ගයක පොහොර නිපදවිය හැකි නමුත් කිසිම යන්ත්‍රයක් එකම දිනක් තුළ පොහොර වර්ග දෙකක් හෝ වැඩි ගණනක් නිපදවීම සඳහා යොදා නොගත යුතු වේ. එක් එක් යන්ත්‍රයෙහි ධාරිතාව, එනම්, එක් එක් යන්ත්‍රයට පැය එකකදී *X*, *Y* යන එක් එක් පොහොර වර්ගයෙන් නිපදවිය හැකි ප්‍රමාණය ටොන්වලින් පහත දී ඇත.

| | *A* යන්ත්‍රය | *B* යන්ත්‍රය | *C* යන්ත්‍රය |
|---|---|---|---|
| *X* වර්ගයේ පොහොර | ටොන් 20 | ටොන් 40 | ටොන් 30 |
| *Y* වර්ගයේ පොහොර | ටොන් 30 | ටොන් 60 | ටොන් 20 |

**28.** *X* වර්ගය නිපදවනු ලැබුවේ *B* යන්ත්‍රයෙන් පමණක් නම්, *X* වර්ගයේ ටොන් 100 සහ *Y* වර්ගයේ ටොන් 150 සඳහා වන ඇනවුමක් නිම කිරීමට කොපමණ කාලයක් ගත වේ ද?
(1) පැය 2 (2) පැය 2 මිනිත්තු 30 (3) පැය 3
(4) පැය 3 මිනිත්තු 30 (5) පැය 4

**29.** *Y* වර්ගය නිපදවනු ලැබුවේ *A* යන්ත්‍රයෙන් පමණක් නම්, *X* වර්ගයේ ටොන් 250 සහ *Y* වර්ගයේ ටොන් 120 සඳහා වන ඇනවුමක් නිම කිරීමට කොපමණ කාලයක් ගත වේ ද?
(1) පැය 2 (2) පැය 2 මිනිත්තු 30 (3) පැය 3
(4) පැය 3 මිනිත්තු 30 (5) පැය 4

**30.** යන්ත්‍ර වැඩිම ක්ෂමතාවෙන් යුතුව භාවිත කරනු ලැබුවේ නම්, *X* වර්ගයේ ටොන් 100 සහ *Y* වර්ගයේ ටොන් 120 සඳහා වන ඇනවුමක් නිම කිරීමට ගතවන අවම කාලය කොපමණ ද?
(1) පැය 2 (2) පැය 2 මිනිත්තු 30 (3) පැය 3
(4) පැය 3 මිනිත්තු 30 (5) පැය 4

**31.** එකිනෙකාට 3 km දුරින් වනාන්තරයක අතරමං වූ සංචාරකයෝ දෙදෙනෙක් ඔවුනොවුන්ගේ නම් ශබ්ද නඟා කියවමින් 1 km $h^{-1}$ වේගයෙන් එකිනෙකා වෙත ආසන්න වෙති. එක් සංචාරකයකුට 1 km පරාසයක් තුළ හඬ නැගිය හැකි අතර අනෙකාට හැකි වනුයේ 0.5 km පමණි. ඔවුන්ට එකිනෙකාගේ හඬ ඇසෙන්නට මිනිත්තු කීයක් ගත වනු ඇති ද?
(1) 30 (2) 60 (3) 75 (4) 90 (5) 120

- අංක **32, 33** සහ **34** ප්‍රශ්න, පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

එක්තරා බුද්ධි අංශයක්, 1950 ජනවාරි 01 සිට දින කේතනය කිරීම සඳහා රහස් භාෂාවක් සකස් කළේය. ඒ අනුව, 1987 පෙබරවාරි 12 දිනය 2789120 ලෙසත් 2001 ජුලි 15 දිනය 7100217 ලෙසත් කේතනය විය.

**32.** 8910217 ලෙස කේතනය වන්නේ කවර දිනය ද?
(1) 1999 ජනවාරි 17 (2) 2003 මාර්තු 15 (3) 2019 පෙබරවාරි 21
(4) 2019 අගෝස්තු 15 (5) 2021 දෙසැම්බර් 21

**33.** කේතනය කරන ලද දිනයක් **නොවිය හැක්කේ** පහත සඳහන් කවරක් ද?
(1) 11100211 (2) 3899120 (3) 11599116 (4) 289911 (5) 1069112

**34.** කලක් ගත වූ පසු, මෙම භාෂාවෙහි බරපතළ අඩුපාඩුවක් බුද්ධි අංශය විසින් හඳුනාගන්නා ලදි. එය ආදර්ශනය සඳහා යොදා ගත හැක්කේ පහත කවර කේතය ද?
(1) 11100220 (2) 4599112 (3) 999912 (4) 2020220 (5) 1210223

**35.** පහත ප්‍රකාශය සලකන්න:
"මඤ්ඤොක්කා වගා කිරීම සඳහා වඩාත්ම සුදුසු පරිසරය වන්නේ වැසි සමයෙහිදී වියළි කලාපය (dry zone) හෝ හරිතාගාරයකි."
ඉහත ප්‍රකාශයෙහි විශ්වසනීයතාව වඩාත්ම බරපතළ ලෙස **දුර්වල** කරන්නේ පහත දැක්වෙන කවර නිරීක්ෂණය සත්‍ය වේ නම් ද?
(1) සමහර මඤ්ඤොක්කා වර්ග හරිතාගාර තුළ නොවැඩෙයි.
(2) සියලුම වර්ගවල මඤ්ඤොක්කා මුලින්ම වගා කෙරුණේ අප්‍රිකානු ප්‍රදේශවල ය.
(3) වැසි සමයේදී වියළි කලාපයේ හරිතගාර තුළ කිසිදු මඤ්ඤොක්කා වර්ගයක් නොවැඩේ.
(4) හරිතාගාර තුළ නොවැඩෙන මඤ්ඤොක්කා ප්‍රභේද හොඳින් ම වගා කළ හැක්කේ නුවරඑළියේ ය.
(5) තෙත් කලාපයෙහි වැසි රහිත කාලවලදී සුපිරි වෙළඳසල්වල මඤ්ඤොක්කා බහුල වශයෙන් අලෙවි කිරීමට තිබේ.

[පස්වැනි පිටුව බලන්න.

- අංක **36, 37** සහ **38** ප්‍රශ්න, පහත දී ඇති විස්තරය මත පදනම් වේ.

$A, B, C, D$ සහ $E$ නමැති පුද්ගලයන් පස්දෙනකු සවිධි පංචාස්‍රයක ශීර්ෂවල සිටගෙන සිටින්නේ $B$ ගෙන් බටහිරට $A$ ද, $E$ ගෙන් නැගෙනහිරට $C$ ද වන පරිදි ය. පංචාස්‍රය දිගේ $X$ සිට $Y$ ට කෙටිම මාර්ගගත දුර dist $(X, Y)$ මගින් අංකනය කරන්නේ යැයි ගනිමු. (නිදසුනක් ලෙස පංචාස්‍රයේ යාබද ශීර්ෂ දෙකක් මත $X$ සහ $Y$ සිටිත් නම්, එවිට dist $(X, Y) = 1$ වේ.)

**36.** පහත දැක්වෙන කවරක් අත්‍යවශ්‍යයෙන් සත්‍ය වේ ද?
(1) $A$ ට දකුණින් $D$ සිටියි.
(2) $D$ ට බටහිරින් $B$ සිටියි.
(3) $D$ ට වඩා $C$, $A$ ට ආසන්න වේ.
(4) $E$ ට වඩා $C$, $B$ ට ආසන්න වේ.
(5) $A$, $D$ ට යාබද නොවේ.

**37.** $X$ සහ $Y$ යනු පංචාස්‍රය මත සිටින දෙදෙනකු නම්, පහත දැක්වෙන කවරක් උපරිම dist $(X, Y)$ විය හැකි ද?
(1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 5

**38.** පහත දැක්වෙන කවරක්, නිගමනය කළ **නොහැකි** වේ ද?
(1) dist $(A, A) = 0$
(2) dist $(A, B) \leq 2$
(3) dist $(A, B) =$ dist $(B, A)$
(4) dist $(A, B) =$ dist $(C, D)$
(5) dist $(A, C) =$ dist $(C, D)$

- අංක **39** සහ **40** ප්‍රශ්න, පහත දැක්වෙන දෑ මත පදනම් වේ.

සමාගමක රැකියාවක් සඳහා ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන් පස්දෙනකු පිළිබඳ තොරතුරුවල සාරාංශයක් පහත වගුවේ දැක්වේ.

| අයදුම්කරු | වයස (අවුරුදු) | ස්ත්‍රී පුරුෂ භාවය | අ.පො.ස. (උසස් පෙළ) ප්‍රධාන විෂයවල ශ්‍රේණි 1 | 2 | 3 | සාමාන්‍ය පොදු පරීක්ෂණය (CGT) | සාමාන්‍ය ඉංග්‍රීසි (GE) |
|---|---|---|---|---|---|---|---|
| 1 | 27 | ස්ත්‍රී | A | A | B | 75 | C |
| 2 | 24 | පුරුෂ | B | C | S | 80 | A |
| 3 | 23 | ස්ත්‍රී | B | B | S | 78 | A |
| 4 | 23 | ස්ත්‍රී | A | B | S | 79 | B |
| 5 | 22 | පුරුෂ | A | B | C | 78 | B |

**39.** ප්‍රධාන විෂයයන් සඳහා අවම වශයෙන් B ශ්‍රේණි දෙකක් ද, සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා ලකුණු 75ට වැඩියෙන් ද, සාමාන්‍ය ඉංග්‍රීසි සඳහා B හෝ ඊට ඉහළ ශ්‍රේණියක් ද ලබා ඇති අයදුම්කරුවකු සඳහා එක් තනතුරක් විවෘත වේ. ඒ සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් කවුරුන් ද?
(1) 3, 4 හා 5 (2) 2, 4 හා 5 (3) 2, 3 හා 5 (4) 1, 4 හා 5 (5) 1, 3 හා 4

**40.** වෙනත් තනතුරක් සඳහා සමාගම, සාමාන්‍ය ඉංග්‍රීසි සඳහා අවම වශයෙන් C ශ්‍රේණියක් ද, අඩු තරමින් එක් ප්‍රධාන විෂයයක් සඳහා A ශ්‍රේණියක් ද, සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා ලකුණු 75ට වඩා වැඩියෙන් ද ලැබූ වයස 22ට වැඩි කාන්තා අයදුම්කාරියක බලාපොරොත්තු වෙයි. මෙම තනතුර සඳහා අයදුම්කරුවන් කී දෙනකු සුදුසුකම් සපුරා ඇත් ද?
(1) එකයි (2) දෙකයි (3) තුනයි (4) හතරයි (5) කිසිවකු නැත

- අංක **41** සහ **42** ප්‍රශ්නවල, නිගමනයක් හා I, II සහ III යනුවෙන් අංක කරන ලද ප්‍රකාශ තුනකින් යුත් තොරතුරු කට්ටලයක් දී ඇත.

  * එක් ප්‍රකාශයක් පමණක් භාවිත කර නිගමනයට එළඹිය හැකි නම් $A$ තෝරන්න.
  * I සහ II ප්‍රකාශ එක්ව භාවිත කර නිගමනයට එළඹිය හැකි නම් $B$ තෝරන්න.
  * I සහ III ප්‍රකාශ එක්ව භාවිත කර නිගමනයට එළඹිය හැකි නම් $C$ තෝරන්න.
  * II සහ III ප්‍රකාශ එක්ව භාවිත කර නිගමනයට එළඹිය හැකි නම් $D$ තෝරන්න.
  * I, II සහ III යන ප්‍රකාශ තුනම එක්ව භාවිත කර නිගමනයට එළඹිය හැකි නම් $E$ තෝරන්න.

**41.** නිගමනය : $P$ නගරයේ සිට $Q$ නගරයට දුර ගණනය කළ හැකිය.
I. $P$ නගරයේ සිට $Q$ නගරය හරහා $R$ නගරයට දුර දී ඇත.
II. $Q$ නගරයේ සිට $R$ නගරය හරහා $P$ නගරයට දුර දී ඇත.
III. $R$ නගරයේ සිට $P$ නගරය හරහා $Q$ නගරයට දුර දී ඇත.
(1) $A$ (2) $B$ (3) $C$ (4) $D$ (5) $E$

**42.** නිගමනය : ශාරීරික පුහුණු වැඩසටහන්වලදී, පුහුණුවන්නන් අභ්‍යාසවලට සහභාගී වන විට ඔවුන්ගේ කායික උෂ්ණත්වය අධික ලෙස ඉහළ නැගීම වැළැක්වීම සඳහා පූර්වෝපාය යෙදිය යුතු ය.


I. කායික උෂ්ණත්වයෙහි වැඩිවීම විජලනයට හේතු විය හැකි ය.

II. යමකුගේ කායික උෂ්ණත්වය 41 °C ඉක්මවුවහොත් ඔහු/ඇය තාප ආඝාතයට (heat stroke) ලක්වීමේ අවදානමක් පවතී.

III. තාප ආඝාතය, හෘදය වස්තුවේ ක්‍රියාකාරිත්වය දුර්වල කරන අතර, මරණයට හේතු විය හැකිය.

(1) *A* (2) *B* (3) *C* (4) *D* (5) *E*

**43.** පවුලේ රාත්‍රි භෝජනයක මාළු සහ කුකුළුමස් යන දෙවර්ගයම අඩංගු විය. පවුලේ සමහර සාමාජිකයන් මාළු පමණක් අනුභව කළ අතර, සමහරු කුකුළුමස් පමණක් අනුභව කළහ. පවුලේ සමහර සාමාජිකයන් එළවලු පමණක් අනුභව කරන්නන් වූ අතර, ඔවුහු මාළු හෝ කුකුළුමස් හෝ අනුභව නොකළහ. පවුලේ ඉතිරි සාමාජිකයෝ මාළු සහ කුකුළුමස් යන දෙවර්ගයම අනුභව කළහ. පහත සඳහන් කවර රූපය වඩාත් තාර්කිකව මෙම තත්ත්වය විස්තර කරයි ද?



(1) (2) (3) (4) (5)

● අංක **44** සහ **45** ප්‍රශ්න මෙහි දැක්වෙන පුවත්පත් දැන්වීම මත පදනම් වේ.

**මහජනතාව වෙත දැනුම්දීමයි**

පාරිභෝගිකයන් වෙත කෙරෙන සැපයුම්වල සහ සේවාවල ගුණාත්මක බව වර්ධනය කිරීමේ අරමුණ පෙරදැරි කර ගනිමින්, විදුලිබල මණ්ඩලය ලැයිස්තුගත ප්‍රදේශවල අලුත්වැඩියා හා නඩත්තු කාර්යයන්හි නිරත වෙයි. එහි ප්‍රතිඵලයක් ලෙස එම ප්‍රදේශවල විදුලි සැපයුම විසන්ධි කරනු ලැබිය හැකිය. සේවා විසන්ධි කිරීම්වල ප්‍රතිඵලයක් ලෙස විදුලි පාරිභෝගිකයන්ට සිදුවන අපහසුතාව පිළිබඳව කණගාටුව පළ කරනු ලැබේ. හැකි ඉක්මනින් විදුලිබල සැපයුම් යථා තත්ත්වයට පත් කිරීම සඳහා මණ්ඩලය විසින් සියලු පියවර ගනු ලැබේ.

**44.** මෙම දැන්වීම මගින් පාරිභෝගිකයන් වෙත සපයනු ලබන ප්‍රධාන තොරතුර කුමක් ද?

(1) විදුලිබල සැපයුමට බාධා සිදුවීම
(2) සැපයුම්වල සහ සේවාවල ගුණාත්මක වර්ධනය
(3) අලුත්වැඩියා හා නඩත්තු කටයුතු
(4) නොවැළැක්විය හැකි බාධා කිරීම් පිළිබඳ කණගාටුව
(5) විදුලිබල සැපයුම යථා තත්ත්වයට පත් කිරීම කඩිනම් කිරීම

**45.** ප්‍රකාශිත ප්‍රදේශවල විදුලි බල සැපයුමට බාධා විය හැක්කේ,

(1) අලුත්වැඩියා හා නඩත්තු කටයුතු නිසා ය.
(2) වර්තමාන සැපයුම්වල අඩු ගුණාත්මක බව නිසා ය.
(3) විදුලිය බිඳ වැටීම් නිසා ය.
(4) පාරිභෝගිකයන්ට සිදුවන අපහසුතා නිසා ය.
(5) විදුලිබල සැපයුම යථා තත්ත්වයට පත් කිරීම නිසා ය.

● අංක **46** සහ **47** ප්‍රශ්නවල, 1 සහ 7 වාක්‍ය අතර ඇති *A, B, C, D, E* වාක්‍ය නිවැරදි අනුපිළිවෙළින් නොමැත. තර්කානුකූල අනුක්‍රමයක වාක්‍ය හත පිහිටන සේ ඒවා පිළියෙල කළ විට, එම වාක්‍යවල නිවැරදි අනුපිළිවෙළ තෝරන්න.

**46.**
1 - ඔයාගේ විද්‍යුත් ලිපිය කියවීමට ලැබීම ගැන මට ඉතා සතුටුයි.
*A* - කොහොමද ඔයාගේ විභාගය, හොඳට කළා ද?
*B* - ප්‍රතිඵල ලැබුණාට පසුව, කරුණාකර අපව බලන්න එන්න.
*C* - ඔයා මාසෙක විතර කාලෙකින් මට විද්‍යුත් ලිපියක් එව්ල නැහැ.
*D* - ඔයා විභාගයට පාඩම් කරන බව මම දැන සිටියා.
*E* - ඔයා හොඳට විභාගය සමත් වන බව මට විශ්වාසයි.
7 - ඔයා අපව බලන්න එන කොට නොවරදවාම ඔයාගෙ ගිටාරය රැගෙන එන්න.


(1) *ACBDE* (2) *CDABE* (3) *CDAEB* (4) *CDEAB* (5) *DCAEB*

**47.**
1 - සිල්වා මහත්මිය ඇගේ ගමෙහි මැටි භාණ්ඩ කර්මාන්තයක් ආරම්භ කළාය.
*A* - කාන්තාවෝ 10 දෙනෙක් දැන් ඇය යටතේ වැඩ කරති.
*B* - තවත් කාන්තාවන් සේවයට බඳවාගනු පිණිස ඈ කිසියම් දැන්වීමක් බොහෝ ස්ථානවල ප්‍රසිද්ධ කළා ය.
*C* - නිෂ්පාදන ක්‍රියාවලිය දැන් සේවා මුර දෙකක් යටතේ ක්‍රියාත්මක වෙයි.
*D* - ඈ ආරම්භයේදී ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ සහයෝගය ලබා ගත්තාය.
*E* - ප්‍රතිචාරය ඉතා යහපත් විය.
7 - සිල්වා මහත්මිය, උද්‍යෝගය පිළිබඳ සැබෑ පරමාදර්ශයකි.

(1) *BDAEC* (2) *BDEAC* (3) *DBAEC* (4) *DBEAC* (5) *DEBAC*

**48.** පහත විස්තර කෙරෙන සිදුවීම නිරූපණය කිරීම සඳහා පින්තූර හයක් ඇඳ ඇත.

"පිරිමි ළමයකු බස් නැවතුමට කඩිනමින් පැමිණි නමුත් ඔහුට බස්රථ දෙකකටම ගොඩවීමට නොහැකි වූ බැවින් සිය ගමන සඳහා ත්‍රිරෝද රථයක පිටත්වීම."




පහත දැක්වෙන කවර පිළියෙල කිරීම මගින් පින්තූර නිවැරදි අනුක්‍රමයට ගළපනු ලැබේ ද?

(1) *DACEFB* (2) *DAECFB* (3) *DAFCEB* (4) *DEACFB* (5) *DEAFCB*

- අංක **49** සහ **50** ප්‍රශ්න, පහත දැක්වෙන සංවාදය මත පදනම් වේ.

මෙම සංවාදය සිදුවූයේ, තම පුතාගේ සහතික පිටපතක් ලබා ගැනීමට විභාග දෙපාර්තමේන්තුවට පැමිණි කාන්තාවක සහ පිළිගැනීමේ නිලධාරිනියක අතර ය. සංවාදය ආරම්භ වනුයේ කාන්තාවගේ උදෑසන සුබපැතුම් සමග වන අතර, අවසන් වනුයේ ඇගේ ස්තුති කිරීමෙනි. සංවාදයෙහි අනෙකුත් කොටස් එකිනෙක මිශ්‍ර කර ඇති අතර *A, B, C, D, E, F, G, H, I, J, K* අක්ෂර මගින් අංකනය කර ඇත.

✻ - සුබ උදෑසනක් මිස් !

*A* - සහතිකය පාවිච්චි කිරීමට බලාපොරොත්තු වන්නේ ශ්‍රී ලංකාව තුළ ද; නැත්නම් විදේශ රටක ද?

*B* - ඔව්, විදේශ රටකදී. මගේ පුතා විදේශ විශ්ව විද්‍යාලයක උපාධි පාඨමාලාවක් සඳහා ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ නිසා ඒක ඉංග්‍රීසියෙන් අවශ්‍යයි.

*C* - ඔව් මා ළඟ තිබෙනවා. ඒත් මම විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ඒක සනාථ කර ගන්නේ කොහොම ද?

*D* - අපේ දෙපාර්තමේන්තුව සහතිකය හෙට උදේට විදේශ කටයුතු අමාත්‍යාංශයට යවනවා. ඔයාට ඒක හෙට දහවල් 12.00න් පසුව විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශයෙන් සනාථ කර ලබා ගත හැකියි.

*E* - සහතිකය තියෙන්නේ ඉංග්‍රීසියෙන්. ඒක විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සනාථ කරවා ගන්න ඕනෑ.

*F* - මම ඒක කර ගන්නේ කොහොම ද?

*G* - ඒක ඔයාගෙම ද?

*H* - නැහැ. ඒක මගෙ පුතාගෙ.

*I* - සුබ උදෑසනක් මැඩම්, මට පුළුවන්ද ඔබට උදව් කරන්න?

*J* - අනේ ඔව්, ඔයාට පුළුවන්ද මට උසස් පෙළ සහතිකයක් ලබා ගන්නේ කොහොමද කියල පැහැදිලි කරල දෙන්න?

*K* - මෙන්න ඉල්ලුම් පත්‍රය. එය නිවැරදිව සම්පූර්ණ කරල, මේ ගොඩනැගිල්ලේ බිම් මහලේ තිබෙන අංක 01 කවුළුවට භාර දෙන්න. එතන ඉන්න නිලධාරියා ඔයාට උදව් කරයි. ඔයා ළඟ විභාග වර්ෂය, විභාග අංකය ආදී අදාළ තොරතුරු තියෙනව ද?

✻ - බොහොම හොඳයි මිස්. ඔයා මුළු වැඩපිළිවෙළම මට හොඳට පැහැදිලි කළා. බොහොම ස්තුතියි!

**49.** කාන්තාව විසින් ඇගේ සුබ පැතුමට සහ ස්තුතියට අමතරව ප්‍රකාශිත සංවාද කොටස් මොනවා ද?

(1) *ABDFH* (2) *ACEGJ* (3) *BCEFG* (4) *BCEFH* (5) *BCFHJ*

**50.** සංවාදයෙහි වඩාත් තර්කානුකූල අනුපිළිවෙළ, පහත දැක්වෙන ඒවා අතුරෙන් කවරක් ද?

(1) *GHFKADCBEIJ* (2) *GHFKCDABEIJ*

(3) *IFDCKJGHABE* (4) *IFGHJABCDEK*

(5) *IJGHABEFKCD*

✻ ✻ ✻

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/